# ලෝකාලෝකය

2021 මැයි - ජූලි කලාපය

මැරුණොත්,
ඒ ඇර මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවෙත්,
දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි සිට
අප උදෙසා මැදහත්කම් කරන්නෙත්
ක්‍රිස්තුස්වහන්සේය
(රෝම 8:34).

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901




# ඇදහිල්ලේ බලය



අද මම පුංචි ඔබට කියාදෙන්න යන්නේ ශුද්ධ බයිබලයෙන් පුංචි කතාවක්. මෙය සැබෑ සිදුවීමකි. එක් පුරුෂයෙක් එලීෂා නම් ඉතා බලවත් අනාගත වක්තෘවරයෙකුට සේවය කරමින් සිටින අතර මිය ගියා. ඉන් පසුව ඔහුගේ භාර්යාවයි දරු දෙන්නයි ආදායමක් නැතිව හොඳටම දුප්පත් වුණා. ගෙදර තිබුණේ භාජනයක තෙල් ස්වල්පයක් පමණයි. මේ ස්ත්‍රිය ගොඩක් ණයවෙලත් හිටියා. ගත්තු ණය ගෙවාගන්නත් ක්‍රමයක් නැතුව ඉන්න අතර ණය හිමියෝ කියා හිටියා, ණය ගෙවන්න බැරිනම් දරු දෙන්නාව මෙහෙකාරකමට ගෙන යනවා කියලා.

ඉතින් මේ අම්මා කරගන්න දෙයක් නැතුව එලීෂා හමුවන්නට ගොස් සියලු විස්තර පැවසුවා. එලීෂා ළඟ මුදල් තිබුණේ නෑ. ඒත් එලීෂා මේ දුප්පත් වැන්දඹුවට දෙවියන්වහන්සේගේ කරුණාව ලබාදෙන්න ක්‍රියා කළා. ගෙදර ගොස් හැකි පමණ හිස් භාජන එකතු කරගෙන ගෙට ඇතුල් වී, දොර වසාගෙන අර තෙල් ටිකක් ඇති භාජනයෙන් අනිත් ඒවාට වත්කරන්න කියලා එලීෂා ඇයට කීවා.

ඒ ස්ත්‍රිය දෙවියන්වහන්සේගේ බලය ගැන සැක නොසිතා එලීෂා කිව් ආකාරයටම කළා. පුදුම දෙයක් සිදුවුණේ. හැම භාජනයක්ම පිරෙන තුරු තෙල් තිබුණා. ඉතිං එලීෂා කියූ ලෙස එම තෙල් විකුණා, ණයත් ගෙවලා, සතුටින් ජීවත් වන්නට ඒ පවුලට හැකි වුණා.

දෙවියන්වහන්සේට කරන්න බැරි දෙයක් නෑ. අපි මේ සත්‍යය අදහාගන ක්‍රියා කරනවා නම් දෙවියන්වහන්සේ අපේ ජීවිත තුළ මහත් පුදුම දේ කරනවා ඇත. **"ඔබ මාගේ නාමයෙන් ඇදහිල්ල ඇතුව ඉල්ලන ඕනෑම දෙයක් ලැබෙන්නේය"යි** යේසුස්වහන්සේ පැවසූ සේක. ළමා අවදියේ සිටම දෙවියන්වහන්සේගේ බලය ගැන දැනගැනීමක් ඇතිව සිටිය යුතුයි. ඉඩ ලැබෙන හැටියට ඉදිරි කාලයේදී අපි දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියා ඉගෙන ගනිමු.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත්, අදත්, සදාකායටත් ඒකාකාරමය **(හෙබ්‍රෙව් 13:8).** එබැවින් අදත් යේසුස්වහන්සේ අප සමඟ ආත්මයෙන් ජීවත් වෙනවා. මේ පුංචි දුවලා පුතාලත් ඔයාලගේ පවුල්වල තිබෙන කරදර ඇදහිල්ලෙන් එතුමන්ට පවසන්න. එසේ පවසා ඊළඟට පිහිට ලැබෙන්නත් කලින්ම හරියට ලැබුණ වගේ ස්තූති කරන්න. එය තමා ඇදහිල්ල කියන්නේ. එවිට ඉල්ලන දේ ලැබෙනවා. කුඩා කල සිටම දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වන්න **(2 රාජාවලිය 4:1-7).**

# නැවත ඉපදීම (Born Again) යනු කුමක්ද?

නැවත ඉපදීම යනු භෞතික හෝ ලෞකික කාරණයක් නොවේ. එය මනුෂ්‍යයකු තුල ඇතුලාන්තයේ ආධ්‍යාත්මික (ආත්මිකව) සිදුවන විපර්යාසයකි. එම විපර්යාසය තවත් මනුෂ්‍යයකුට හෝ ස්ත්‍රියකට තව කෙනෙකු උදෙසා ඉටුකිරීමට නොහැකිය. මෙම නැවත ඉපදීම සංකල්පය නොහොත් ධර්මය සඳහන් වන්නේ ශුද්ධ බයිබලයේ යේසුස්වහන්සේගේ ඉගැන්වීමෙහි පමණි. මෙය ආගමික භක්තිවන්තභාවයෙන් හා ආගම ඇදහීමෙන් ඔබ්බට ගිය මිනිස් හදවත් තුල දෙවියන්වහන්සේ ඉටු කරන ආත්මික විපර්යාසයකි. බොහෝ දුරට මෙම ජීවිත විපර්යාසය පිටතට නොපෙනේ. නැවත ඉපදීම ලැබූ අය ආගමික කල්ලියක් නොවේ. එසේම සමාජ විරෝධි ක්‍රියා කරන කල්ලියක් ද නොවේ. මෙම පිරිස ලෝක ජනගහනයෙන් ඉතා සුලුතරයකි. බයිබලීය ප්‍රතිපත්ති, මූලධර්මවලට අනුව තම ජීවිතය මෙහෙයවන, සියලු පාපවලින් වැලකී, දුසිරිතෙන් තොර සරල, චාම්, දේවභය සහිත පිරිසකි. ඔවුන් පාපය, මුලුමනින්ම ප්‍රතික්ෂේප කරන අතර අන් අයකුට අයුත්තක්, නපුරක් කිරීමෙන් හැමවිටම වැළකී සිටියි. ක්‍රිස්තුස් යේසුස්වහන්සේ හැසිරුණාක්මෙන් හැසිරීමට උත්සහ දරයි. අද අප සමාජය තුල Born Again කල්ලිය ලෙස මාධ්‍යය තුලින් හංවඩු ගසන්නේ මෙම සමාජයට කිසිම නපුරක් නොකරන දේවභක්තික පිරිසක්ය.



මෙය ඉතාම ද්වේශ සහගතය, කල්ලිය ලෙස හැඳින්වීමෙන්ම මෙය හිතාමතා කරන නපුරු ක්‍රියාවක් බව හැගෙයි. පාතාල කල්ලිය, හොරු කල්ලිය, මැර කල්ලිය වැනි නපුරු ස්වභාවයක් හා වර්ණයක් දීමට යම් පිරිසක් උත්සහදරා ඇති බව පෙනීමට තිබේ. කරුණාකර කිතුණු නැවත ඉපදීම ලැබූ කණ්ඩායම ලෙස හැඳින්වීම යෝග්‍යය. ඔබගේ තීක්ෂණ බුද්ධිය භාවිතා කොට නැවත ඉපදීම ලැබූ අය පිළිබඳ හොයා බලන මෙන් මම ඇරයුම් කරමි.

## නැවත ඉපදීම ලබන්නේ කෙසේද?

මෙම අත්දැකීම ලබාගැනීමට නම් ශුද්ධ බයිබලය විශ්වාස කළ යුතු අතර බයිබලයේ සඳහන් අහස, පොළව මැවි සර්වබලධාරී දෙවියන්වහන්සේද විශ්වාස කළ යුතුය. ඇදහිල්ල විශ්වාසය මත පදනම්වූ ජීවිත විපර්යාසය බයිබලය අර්ථ දක්වන්නේ නැවත ඉපදීම ලෙසය.

★ බයිබලයෙන් කියවා තේරුම් ගත යුතුදේ, තමා පව්කාරයකු බවත්, තමන් මරණින් පසු අපායට (නිරයට) යාමට සිදුවන බවත්, තමාටම තමා ගලවා ගැනීමට නොහැකි බවත් අවබෝධ කර

ගත යුතුය.

**"සියල්ලෝ පව්කොට දෙවියන් වහන්සේගේ මහිමයෙන් හීනවී සිටිති" - (රෝම 3:23).**

**"පාපයේ කුලිය මරණයයි" - (රෝම 6:23).**

★ තමාගේ පව්කාරකම හා අසරණභාවය අවංකව තේරුම් ගත යුතු අතර එම ස්වභාවය ගැන පසුතැවිලි වී එම තත්වයෙන් ගැලවීම, මිදීමට තිබෙන පිලියම බයිබලයෙන් සොයා දැනගෙන එයට කීකරු වීමට කැමති වූ විට දෙවියන්වහන්සේගේ ආත්මයාණෝ ඔහු හෝ ඇය සමඟ ක්‍රියා කිරීමට පටන් ගනී.

**"පාපයේ කුලිය මරණයයි, නමුත් දෙවියන්වහන්සේගේ දීමනාව (තෑග්ග) නම්, අපගේ ස්වාමී වූ යේසුස්වහන්සේ තුල සදාකාල ජීවනයයි" - (රෝම 6:23).**

පව්කාරයන් වන මනුෂයන්ට මරණය නොහොත් සදාකාල විනාශය නියමව තිබුණත්, දෙවියන්වහන්සේ විසඳුමක් ඉදිරිපත් කර ඇත. එනම් යේසුස්වහන්සේ කරණකොටගෙන සදාකාල ජීවනය, නොහොත් අමාමහ ජීවනය (මරණින් පසු යහපත් ස්ථානයක්) ලැබෙන බව සහතික කරයි.

**"ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාග න්නා සැමදෙනා විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය" - (යොහාන් 3:16).**

මේ ආකාරයෙන් පාපය හා පාපයෙන් ගැළවීමට ඇති මාර්ගය බයිබලයෙන් තේරුම් ගැනීම හා අවබෝධ කර ගැනීම පළමුව වැදගත්ය. තමාගේ පාපයේ වන්දිය හා දඬුවම යේසුස්වහන්සේ කුරුසිය මතදී ගෙවා දැමූ බව විශ්වාස කර උන්වහන්සේගේ ලේ වලින් තම පාපය පවිත්‍ර කරන ලෙසත්, උන්වහන්සේට ඔබේ සිතට වඩින ලෙස ආරාධනා කරන්න. එවිට ශුද්ධාත්මයාණන් ඔබ තුලට පැමිණ ඔබගේ ආත්මය තුල මෙම විපර්යාසය සිදු කරනු ඇත.

නැවත ඉපදීමට අවශ්‍ය සාධක දෙක නොහොත් ඒජන්තවරු දෙදෙනා වන්නේ වතුර හා ආත්මයාණන්ය. **(යොහාන් 3:5)** මෙහි වතුර ලෙස දේව වචනය සංකේතවත් කරයි. **(එපීස 5:28)** ආත්මයාණන් ලෙස දෙවියන්වහන්සේගේ ආත්මය සඳහන් වේ. දේව වචනය කියවා තේරුම් අරන් පසුතැවිලි වන විට ආත්මයාණන් පැමිණ මෙම කර්තව්‍යය ඔබ තුල ඉටු කරයි. එම අත්දැකීම ලැබූ අයට තමා තුලම දැනෙන අතර එය බාහිරින් දැක බලා ගැනීමට නොහැක. එහෙත් එතැන් පටන් ඔහුගේ හෝ ඇයගේ සිතන පතන ආකාරය වෙනස් වේ. මෙය නැවුම් අත්දැකීමකි. ජීවිතය කාලයක් පුරාවට හදවතේ තිබුණු හිස්කම නැතිවී ගොස් තමා සමඟ තව කෙනෙකු සිටිනවා යැයි හැගේ. මක්නිසාද ශුද්ධාත්මයාණන්වහන්සේ එම පුද්ගලයා තුල නිරන්තරයෙන් වැඩ සිටියි.

★ **යමෙක් අලුතෙන් නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්න නොහැකිය (යොහාන් 3:3).** එසේ අලුත් ඉපදීම ලැබූ අය තම මරණයෙන්

පසු දෙවියන්වහන්සේගේ රාජ්‍යයට නොහොත් දිව්‍ය ලෝකයට ඇතුලත් වේ. එනම් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීමයි. නැවත ඉපදීම නොලැබූ සියලු දෙනාම විනාශයට නොහොත් අපායට ගමන් කරයි.



**නැවත ඉපදීම ලැබූ මොහොතේම මනුෂයකු තුල සිදුවනදේ.**

1. යේසුස්වහන්සේ නැවතී සිටීම පිණිස මනුෂ්‍යයාගේ හදවතට වැඩම කිරීම **- (එළිදරව් 3:20).**

2. ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලැබීම. (කිසිම පාපයක් නොකළ අයකු ලෙස පව් පින් ගණන් ගනු ලබන දෙවියන්වහන්සේ විසින්ම එම පුද්ගලයා පිළිගැනීම) **- (රෝම 5:1 / 8:1).**

3. හෘද සාක්ෂිය යේසුස්වහන්සේ ලේ වලින් පවිත්‍ර කිරීම. (උපන්දා සිට කල සියලු පාප සඳහන් වී ඇත්තේ මනුෂ්‍ය ආත්මය තුළ ඇති හෘද සාක්ෂියේය) **(හෙබ්‍රෙව් 9:14).**

4. යේසුස්වහන්සේ තුළට බෞතීස්ම කිරීම. (එනම් යේසුස්වහන්සේ සතු සියලු දේට සම්බන්ධ කිරීම **(රෝම 6:3).**

5. යේසුස්වහන්සේගේ මරණය හා තැන්පත් කිරීම, හා නැවත නැගිටීම තුළට බෞතීස්ම කිරීම. (යේසුස්වහන්සේ සමඟ මැරුණා, තැන්පත් කළා, නැවත නැගිට්ටා යන සංසිද්දි තුනටම සම්බන්ධ කිරීම) **(රෝම 6:4).**

6. යේසුස්වහන්සේගේ ශරීරය (සභාව) තුළට බෞතීස්ම කිරීම. (එනම් විශ්ව සභාවේ සාමාජිකයෙක් බවට පත් කිරීම) **(1 කොරින්ති 12:13).**

7. දෙවියන්වහන්සේගේ ජීවන පොතේ එම පුද්ගලයාගේ නම සටහන් කිරීම (එනම් දෙවියන්වහන්සේගේ දරුවකු ලෙස ස්වර්ගයෙහි සහතික කිරීම) **(එළිදරව් 17:8 / 20:12 / 20:15).**

ඔබත් නැවත ඉපදීම ලබා තිබේද?

- සංස්කාරක -
**එස්. මෙත්තානන්ද**
**077 8813197**




# කිසිවෙකුටත්, කිසිවිටෙකත් නැවැත්විය නොහැකි මරණය.



ලෝකයේ ජීවත් වන සෑම කෙනෙක්ම නිසැකවම දන්නා කරුණක් තිබේ. එනම් තමා යම් දවසක මරණයට පත්වන බවයි. කිසිවෙක් ඊට ආශානොකරයි. සිතීම පවා සමහරකු භීතියට පමුණුවයි. මම මැරෙන්ට බය නොවෙමියි සමහරෙක් පවසතත් යටිසිත එය ප්‍රිය නොකරයි. හදවත් බද්ධකිරීමට තරම් මිනිසා තම ඥාණය දියුණු කරගෙන ඇත. එහෙත් මරණය නතර කිරීමට සමතෙක් මේ පොළොවෙහි සිටීද?

**"ඔහු තමාගේ මව් කුසෙන් නික්ම ආ ලෙසම නිර්වස්ත්‍රව නැවත යන්නේය. තමාගේ අතින් ගෙන යා හැකි කිසිවකුත් ..... ඔහු ගෙනයන්නේ නැත" (දේශනාකාරයා 5:15). "මක්නිසාද මනුෂ්‍යයා තමාගේ සදකාලගෙට හැරී යන්නේය" (දේශනාකාරයා 12:5).**

ඔබේ සදාකාල නිවාසය කොතැනද?

අලංකාර ලෙස ගොඩනැගූ නිවාස පිළිබඳ දැන්වීම් ඔබ දිනපතා පුවත් වල දකිනවා ඇත. ඔබට නිවසක් නැත්නම් හෝ තිබෙන එක අබලන්වී නම් ඒ ලස්සන නිවසක් අයිතිකර ගැනීමේ ආශාවක් ඔබට ඇති වෙනවා ඇත. නමුත් ඒ සඳහා රුපියල් මිලියන කිහිපයක් වැය කළ යුතුව තිබේ. කොපමණ වටිනා වුවද සියල්ල තවකාලිකයි. නොමිළයේම ලබාගතහැකි සදා කාලික නිවාසයක හිමිකරු වීමේ මාර්ගයක් තිබෙන බව මා සඳහන් කරන විට ඔබ මවිතවන්නට පුලුවනි. එය සත්‍යයකි. මා එය සත්‍යයක් යයි පවසන්නේ ශු. බයිබලය එසේ සඳහන් කරන නිසයි. මන්ද ශුද්ධ බයිබලය යනු දෙවියන්වහන්සේගේ පොතයි. එහි ලියැවූ සියල්ල සත්‍ය බවට විද්‍යාඥයෝ පවා පිළිගනිති. ඊට බොහෝ ඔප්පු සාක්ෂි තිබේ.

**"මාගේ පියාණන්වහන්සේගේ ගෘහයෙහි (ස්වර්ගයෙහි) බොහෝ වාසස්ථාන තිබේ. එසේ නොවුයේ නම් මා විසින් නුඹලාට දන්වනවා ඇත" යේසුස්වහන්සේ කීවූ සේක (යොහාන් 14:6).**

මරණය ගැන නම් ඔබට නිසැකය. මරණින් පසු ජීවිතයක් තිබෙන බව ඔබට සැක සහිත විය හැකිය. ස්වර්ගයත්, නිරයත්, මේ පොළොවම යයි සමහරු කල්පනා කරති. එය සිතුවිල්ලක් පමණි.

පොළොවේ සාතන්ගේ ආත්මය ක්‍රියාකරන බැවින් එය නිරයේ ස්වරූපයක් මෙන් පෙනෙනවා ඇත. එහෙත් පොළොව නිරය නොවේ. දෙවියන්වහන්සේගේ දරුවන් ඒකරාශී වන තැන යේසුස්වහන්සේ ඔවුන් මධ්‍යයෙහි වැඩ වසන සේක. එතැන ස්වර්ගික ස්වරූපයක් ගනී. එහෙත් ස්වර්ගය හා නිරය නම් සදාකාලික ස්ථාන දෙකක් එකිනෙකින් වෙන්ව විශාල පරතරයකින් පිහිටා තිබේ **(ලූක් 16:16)**.

දේශනාකාරයා අපට මේ අනතුරු ගෙන එයි. **"දූවිල්ල තිබුණ හැටියට (ශරීරය) පොළොවට හැරී යන්ටත්, ආත්මය ඒක දුන් දෙවියන්වහන්සේ වෙතට හැරී යන්ටත් පළමුවෙන් උන්වහන්සේ සිහිකරන්න" (දේශනාකාරයා 11:7).** මනුෂ්‍යයෙකුගේ මරණයේදී ඔහුගේ ශරීරයෙන් ආත්මය වෙන්වේ. දැනීම, දැකීම හැඟීම ජීවනය සියල්ලෙන් සම්පූර්ණ ආත්මය ඉහත කී ස්ථාන දෙකෙන් එකකට ඇතුල්වීමට නියමිතය. ස්වර්ග රාජ්‍යයට හෝ නිරයට මේ සඳහා තෝරා ගැනීම පවතින්නේ ජීවත්ව සිටින කාලයේදීමය. එසේම එය පෞද්ගලික තීරණයක්ය.

ඔබ අතරින් කිසිවෙකු නිරයට යන්නට ආශානොවනවා ඇත. එය පව්කාරයින් සඳහා වෙන්ව ඇත. ස්වර්ගයට ඇතුලුවීමට අවසර තිබෙන්නේ ශුද්ධවන්තයින්ට පමණි. එකම පාපයක්වත් නොකළ - පව්කාර ස්වභාවයෙන් තොර කෙනෙකුට හෝ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පව්කමාව ලබා සිටින කෙනෙකුට ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීමට අවසර තිබේ. පාපයේ කිලුටු බවින් තොරව මෙලොව ජීවත්වූ එකම තැනැත්තා යේසුස්වහන්සේ පමණයි. එතුමා මිනිස් ස්වභාවය ගෙන ලොව බිහි වූ එකම වූ දෙවියන්වහන්සේය.

දෙවියන්වහන්සේ මිනිස් ස්වභාවය ගෙන ලොව බිහිවුණේ ඇයි? එකම අරමුණ මනුෂ්‍යයාට පව්න් මිදීම ලබා දී ස්වර්ග රාජ්‍යයට සුදුසුකම ලබාදීමයි. පාපයට දඬුවම නම් මරණයයි. **"පාපයේ කුලිය නම් මරණයයි" (රෝම 6:23)** මේ අනුව පව්කරන සියල්ලෝම මරණීය දණ්ඩනය ලැබිය යුත්තාහ. දෙවියන්වහන්සේගේ ප්‍රේමය ඔබවත් මාවත් එම අවාසනාවන්ත දඬුවමින් එනම් සදාකාලික නිරයෙන් මුදාගැනීමට ඉදිරිපත් වේ. එය සිදුවූයේ කෙසේද? යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපේ පාපයේ මිලය, වන්දිය, සිය ජීවිතයෙන් ගෙවා නිමකළසේක. එය මහා පුදුම ප්‍රේමයක් නොවේද? සැබවින්ම ඒ මහා ශ්‍රේෂ්ඨ ජීවිත පරිත්‍යාගය එදා කල්වරි කන්ද මතුයෙහි සිදුවිය.

සෑම මනුෂ්‍යයෙකුම පාපයේ බීජය උපතින්ම උරුමව සිටී. **සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනවී සිටිති (රෝම 3:23).** ඔබ කුඩා දරුවන් පවා කේන්ති ගන්නවා දැක තිබේ. මෙම පාප බීජය රහිතව ලොව බිහිවූ එකම මනුෂ්‍යයා යේසුස්වහන්සේ පමණයි. එම නිසා පව්කාර ලෝකය වෙනුවෙන් ජීවිතය පිදීමට හැකි එකම සුදුස්සාද එතුමා පමණයි. කල්වාරි කන්ද මුදුනත ඒ පව් රහිත එකම මිනිසා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ලී කුරුසියක් මත දිවි දුන්සේක. දිව්‍ය සැලැස්ම එසේ විය. අවශ්‍ය නම් තම දිව්‍ය බලය

පාව්ච්ච්කර එම මරණයෙන් ඉවත් වීමට උන්වහන්සේට පුලුවන්කම තිබුණි. "**කිසිවෙකු ඒක මාගෙන් ගන්නවා නොව, මමම ඒක දෙමි" (යොහාන් 10:18).**

යේසුස්වහන්සේ කුරුසියේ දිවි පිදීමෙන්ම එය කෙළවර නොවිය. එතුමා මරණය පරාජයකර නැගිටුවණාසේක. පන්සියකට වැඩි ගනණකට ප්‍රකාශවූසේක. දින 40කට පසු ගෝලයන් බලාසිටියදීම ස්වර්ගයට නැගුණාසේක. **(කොරාන්ති 15:3-9)** අදත් උන්වහන්සේ ස්වර්ග රාජ්‍යයෙහි ශරීරයෙන් යුක්තව වැඩ වසන සේක. ස්වර්ග රාජ්‍යයට ඇතුලුවන මාර්ගය කුමක්ද? **"මාර්ගයද, සැබෑවද, ජීවනයද, මමය. මා කරණකොටගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත"** යේසුස්වහන්සේ පැවසූසේක **(යොහාන් 14:6).**

යේසුස්වහන්සේ සිය අමිල වූ පිරිසිදු වූ පාප කිලුටක් නැති අනර්ග ලෙයින් මිලය ගෙවා ඔබගේ ස්වර්ග ගුවන්බලපත්‍රය ලබාගෙන තිබේ. ඔබට තිබෙන්නේ තවත් බලා නොසිට උන්වහන්සේ වෙත ගොස් එම තිළිණය පිළිගැනීමයි. ඒ සඳහා ඔබට කරන්නට තිබෙන දේ ඉතාම සුලුයි. එසේම ඉතාම වැදගත් ද වේ.

පළමුව ඔබ තුළ පාප බීජය, පව්කාර ස්වභාවය පවතින බව එනම් ඔබ පව්කරුවෙකු බව පිළිගන්න. දෙවනුව යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබව පවින් හා නිරයෙන් ගළවා ගැනීමට තම නිර්මල ජීවිතය පූජා කළබවත් මරණය පරාජය කර නැගිටුණ බවත්, අදත් ජීවමානව වැඩ සිටින බවත් පිළිගන්න. දැන්

**"ප්‍රේමණීය යේසුස්වහන්සෙ, පව්කාරවූ මට කරුණාකල මැනවී, ඔබවහන්සේ මට පාපයෙන් කමාවදී, ස්වර්ගය අයිතිකර දීමට දිවි පිදූ බවත්, මරණින් නැගිට ජීවමානව වැඩ සිටින බවත් අදහන්නෙමි. ඔබවහන්සේ මාගේ එකම ගැලවුම්කාරයානන් ලෙස අදහාගනිමි. මගේ පව් සිත සෝදා මේ මොහොතේම මා තුලට වැඩිය මැනවී; ආමෙන්"**



යේසුස්වහන්සේ ආත්මයෙන් ඔබ ඉදිරියේ සිටින බව සිතට ගෙන මේ වාගේ සරල යාච්ඤාවක් කරන්න. ඔබ අවංකව මේ තීරණය ගත්තා නම් අපට ලියන්න. ඔබට ආත්මික වර්ධනය වීමට අපි මඟ පෙන්වන්නෙමු.

**- ජීවන හඬ -**




# කුහුඹුවා

ඉතා කුඩා සතෙක් තුලින් හිතෝපදේශ කතුවරයා අපට උගන්වන පාඩම මහත් විශාල බව අවිවාදයෙන් පිළිගත යුතුයි. බයිබලයේ කුහුඹුවා ගැන මා කියවා ඇත්තේ ඉතා ස්වල්ප වශයෙන්. **හිතෝපදේශ පොතේ 6 වන පරිච්ඡේදයේ 6 වන පදයේ සිට 8 වන පදය දක්වාත්, හිතෝපදේශ 30 පරිච්ඡේදයේ 25 පදයේත්** කුහුඹුවා ගැන සඳහන්වී තිබේනවා. මේ කුඩා සතා ගැන නොදන්නා කෙනෙක් නැහැ. උගෙන් උගත හැකි පාඩම් බොහෝ වෙතත් ඌ ගැන කිසිවෙක් සැලකිල්ලක් දක්වන්නේ නැහැ කීම වඩා සත්‍යයයි. ඌ ගැන දක්වන සැලකිල්ලක් වේනම් ඒ කුහුඹුවා දෂ්ඨ කිරීමේදී වහාම ඌ වෙතින් හා කුහුඹු ගුල වෙතින් හැකි තරම් ඉක්මනින් ඉවත්වීම පමණයි. එහෙත් ශුද්ධ ලියවිල්ල මේ පුංචි සතා පිළිබඳව අපට මෙසේ උගන්වයි. **"අලසය කුහුඹුවා ළඟට ගොස්, උගේ මාර්ග බලා ඥානවන්ත වෙන්න;" (හිතෝපදේශ 6:6).** ඔබේ කම්මැලි ජීවිතය, අලස ආත්මය යළිත් ප්‍රබෝධමත් ක්‍රියාශීලි තත්වයකට පත්කර ගන්න ඔබ කැමතිද? එසේනම් කුහුඹුවා ආදර්ශයට ගන්නැයි මම ඔබට කියමි.

## ගබඩාකාරයා.

කුහුඹුවාට ප්‍රධානියෙක් නැති බවද ඌට මුලාදෑනියෙක්වත් ආණ්ඩුකාරයෙක්වත් නැති බවද **හිතෝපදේශ 6:7** දක්වයි. ඔබ ගැන කෙසේද? ස්වාමියා නැති තැන සේවය අතපසු කරණ අලසව අත්පොරවා ගන්න ඔබට කුහුඹුවා ටොක්කක් අනී. **"දෙවියන්වහන්සේගේ වැඩ අලසකමින් කරන්නාට ශාපවේවා" (යෙරමියා 48:10).** ඔබ ගැලවීම ලබා ඇත්නම්, ස්වාමින්වහන්සේ තුල වැඩීම සඳහා ඔබට සහභාගිකම, යාච්ඤාවේ පැවතීම, දේව වචනය කියවීම හා ඉගෙණීම, ස්වාමීන්වහන්සේ සිහිකිරීමේ රාත්‍රී භෝජන මෙහෙය, සාක්ෂි දැරීම, ස්වාමින්වහන්සේට ආත්ම දිනීමට වෙහෙසීම, යහපත් වැඩ වලට කාලය, ශ්‍රමය, මුදල් දීම "දෙවියන්වහන්සේගේ වැඩ" වලට ඇතුලත්ය. ඔබ ඒවා අලසකමින් කරන්නෙහි නම් ඔබ ශාපවල උරුමය ලබයි. එපමණක් නොව ඔබේම ජීවිතය හිඟකමට පැමිණෙයි **(හිතෝපදේශ 6:11 බලන්න).**



මෙන්න ඔබේ අලසකමට කුහුඹුවාගෙන් පාඩමක්: ඌ ග්‍රීෂ්ම කාලයේ පයට පෑගෙමින් අව්වට වේලෙමින්, වෙහෙසෙමින් හාල් හුණු සහල්, සීනි කෑම, ධාන්‍ය කැබලි, කරවල කුඩු ආදිය ස්වකීය ගබඩාවට රැස්කර ගනී. ඒවායින් එදිනෙදාට සෑහෙන පමණ පාවිච්චියට ගන්නා කුහුඹුවා ඉතිරිය වැසි සමය සඳහා ප්‍රවේශමෙන් ගබඩා කර ගනී. තිබුණ පලියට, ලද තරමට නාස්ති නොකරයි. පමණ දැන ක්‍රියා කරන යහපත් දේව දරුවාගේ ශුද්ධාත්ම ඵලයක් වූ එම ගුණය **(ගලාති 5:23)** කුහුඹුවා ප්‍රකට කරයි. ඌ විශ්වාසවන්ත ගබඩාකාරයෙකි. ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට නොදිරන මල නොබැඳෙන වස්තු රැස්කරන්නෙක් වනු දකින්නට යේසුස්වහන්සේ බලාපොරොත්තු වන සේක **(මතෙව් 6:19 සිට 21 දක්වා).**

## උත්සාහවන්තයා

කුහුඹුවෙක් බිත්තිය දිගේ නගිනු මම බලා සිටියෙමි. උගේ තුඩග වූයේ පාන් වාටි කැබැල්ලකි. එය කුහුඹුවාට බර වැඩිවූ නිසා වරින්වර කුහුඹුවා පෙරලුණේය. ඌ යලි නැගිට්ටේය. යලි පාන් වාටියට යට වී වැටුණේය. මොහොතකින් යලි ඉන් බේරීගෙන පාන් කැබෙල්ල ඇදගෙන යන්නට තැත් කළේය. උත්සහය ව්‍යවර්ථ වූ තැන කුහුඹුවා ප්‍රයත්නය අත්හැර දමා යනු ඇතැයි මට සිතිණි. ඌ ඇවිද ගොස් කුහුඹුවකු මුණගැසී තමාට අත් වූ වාසිය ගැන කීවේය. එහෙත් එය තමාට "බර වැඩි" බැවින් කොටස්කරුවකු වනලෙස අනික් කුහුඹුවාට ඇරයුම් කළේය. ඌ ද එකඟ විය. දෙදෙනාම පාන් වාටි කැබැල්ල ලඟට ආහ. උත්සාහයක් දැරූහ. දෙදෙනාම වාටියට යටවූහ, යලි මතු වූහ. පළමුවැන්නා දෙවැන්නා පාන්වාටිය මුරයට තබා යලි ගමන් කළේය. හමුවූ කුහුඹුවන් සමග සාකච්ඡා කළේය. තවත් කුහුඹුවන් කිහිපදෙනෙකු කැඳවාගෙන ආවේය. පැයකට පමණ පසු මා දුටුවේ විශාල කුහුඹුවන් පිරිසක් විසින් එක්සත්ව ඔසවාගත් පාන්වාටිය බිත්තිය දිගේ බොහෝ ඉහළට ඇදීගොස් ඇති බවකි. බදාගෙන රහසින් කෑමක් නැති කුහුඹුවා එක්සත්ව බෙදාගෙන කමින් කුම්මැහි, කුඩුකේඩු, තණ්හාසික ලෝකයට සරදම් කරයි. **(හිතෝපදේශ 30:24,25)** බලන්න. **කුඩා නමුත් ඉතා ඥානවන්තවූ ජාතීන් සතරක් පොළොවෙහි ඇත. කුහුඹුවෝ බල නැති සමූහයක්ය. එහෙත් ග්‍රීෂ්ම කාලයෙහි උන්ගේ කෑම සපයා ගනිති.**

## තෑගිදීම් හා සුසුම්ලෑම්.

එක්සත්කම ඉතා වැදගත්ය. ඇඳහිලිවන්තයා පරාර්ථකාමියෙක් විය යුතුය. **(ලූක් 6:35, ලූක් 6:38, ක්‍රියා 2:11, 2 කොරින්ති 2:7, කි/යා 4:32)** ආත්මාර්ථකාමී ඇදහිලිවතා දෙවියන්වහන්සේට දුන් ත්‍යාගි මුදල හෝ දසයෙන් කොටසද පොතක ලියා පසුව ගැන බලා සුසුම්ලයි. එසේ නැතහොත් උපකාර කිරීම උතුම්බව අන්‍යයන්ය පහදා දෙමින් තමාගේ සාක්කු තරයේ පියවා ගනී. කුහුඹුවා එසේ නොවේ. ඒ කුඩා සතා ඥානවත් බවත් එසේම තම හිතවතුන්ගේ යහපත පිණිස ඕනෑ වූ විට ජීවිතය දෙන බවත් ඔබ සිතා බැලුවාද? කුහුඹු ගුලක් ලඟ ඔබ සිටිනවිට උගේ මාර්ගය අවහිර කිරීමට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කරන කුහුඹුවා සිය තුඩගින් ඔබට දෂ්ඨ කරයි. ඔබ කරන්නේ පාදවල එල්ලී සිටින කුහුඹුවන් වහාම ඉවතට ගසා පාගා දැමීම නොවේද? සිය ගණන් කුහුඹුවන් දිවි දෙමින් ගුල ඇතුලත සිටින කුහුඹුවන්ගේ රැකවරණය සළසාදීම කෙතරම් සිත්ග න්නා සුලුද? යේසුස් ස්වාමීන්වහන්සේ ඔබ වෙනුවට පෑගුණේත්, පහර ලැබුවේත් මරණය වින්දේත්, ඔබට සදාකාල මාවත පහදනු පිණිසය. නායකත්වයක් ඇති මිනිසා කැරලි ගසමින්, අලස වෙමින්, එක්සත්කම බිඳගන්නා අතර පුංචි කුහුඹුවා සිනාසෙනු ඇත. ඌට නායකයෙක් නැතිව කීකරුවෙමින්, කඩිසරව ක්‍රියාකරමින්, එක්සත්කම තහවුරු කරගන්නට තරම් ඥානයක් තිබේ. එබඳු කඩිසරවූ, කීකරුකමින් හා එක්සත්කමින් ක්‍රියාකරණ ඥානයක් අපිද ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ඉල්ලමු!

**- ප්‍රන්සිස් විජයසිංහ -**

# සාලමොන්ගේ ගීතය හෙවත් ගීත අතරේ උතුම් ගීතය.

ශුද්ධ බයිබලයේ ඇතුලත්ව තිබෙන වෙනස්ම මාදිලියේ පොතක් ලෙස සාලමොන්ගේ ගීතිකාව හැඳින්විය හැක. බොහෝ ඇදහිලිවතුන් මෙම බයිබලීය පොත අධ්‍යනය කොට නැත. එයට හේතුව වියහැක්කේ එහි දිගහැරෙන කතාවේ ස්වරූපයයි. එය ගීත නාටකයක ආකාරයෙන් ලියවුණු ප්‍රේම වෘතාන්තයකි. මෙම ගීතයට ලෝක සාහිත්‍යයේද හිමිවන්නේ මුල් තැනකි. මෙම ගීත සාලමොන් රජතුමා විසින් මුලින් ලියනු ලැබ ඇත්තේ නාට්‍යයක ආකාරයෙන් බව පැහැදිලිය. මෙම නාට්‍යයට ප්‍රධාන චරිත තුනක් තිබේ. සාලමොන් රජතුමා හෙවත් මනමාලයා, ෂූලම්මීය ස්ත්‍රිය හෙවත් මනමාලිය සහ කතාවේ තැනින් තැන මැදිහත් වන යෙරුසලමේ දූවරු යන ඒ චරිත තුනයි. මෙම ලිපියෙහි මාගේ අරමුණ වනුයේ මෙම ගීතයේ පළමු පද කිහිපය තුලින් ආත්මික සිතුවිලි කිහිපයක් ඔබ හමුවේ තැබීමයි. ඒ පද කීපය මෙසේය.

**01. "සාලමොන්ගේ උතුම් ගීතිකාවයි"**

**02. "ඔහු තමාගේ මුඛයේ සිඹීම්වලින් සිඹීවා. මක්නිසාද නුඹේ ප්‍රේමය මුද්‍රිකපානයට වඩා හොඳය"**

**03. "නුඹේ විලවුන් මිහිරි සුවඳින් යුක්තය. නුඹේ නාමය වැගිරෙවූ විලවුන් මෙන්ය. එබැවින් කනයාවෝ නුඹට ප්‍රේම කරති"**

**04. "මා ඇද ගනින්න. අපි නුඹ අනුව දුවන්නෙමුව. රජ තමාගේ ඇතුල් ගෙවලට මා පැමිණෙව්වේය. අපි නුඹ කෙරෙහි ප්‍රීති සන්තෝෂ වන්නෙමුව. මුද්‍රික පානයට වඩා නුඹේ ප්‍රේමය සඳහන් කරන්නෙමුව. ඔවුන් නුඹට ප්‍රේම කරනවා ඇත" (සාලමොන්ගේ ගීතිකා 1:1-4).**

ශුද්ධ බයිබලයේ මෙවැනි පොතක් ඇතුලත්ව ඇත්තේ ඇයි ද යන පැනය ඔබගේ සිතට නැගෙන්නට පුළුවන. සැමවිටම දෙවියන්වහන්සේ අපට වඩා ප්‍රඥාවන්ත බව අපි සිහි කරගනිමු. බයිබලයට උන්වහන්සේ ඇතුලත් කර ඇත්තේ අපගේ ආත්මික ජීවිතයට ප්‍රයෝජනවත් දේ පමණි. " **දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත්, හික්මවීමටත්, තරවටු වටත්, ධර්මිෂ්ටකම ගැන ගුරුකම් දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ" යැයි 2 තිමෝති 3:16** සඳහන් වේ. මේ හේතුවෙන් සාලමොන්ගේ ගීතිකා පොතද භක්ත්‍යාදර දේවභය සිතකින් කියවා ඉගෙනගැනීම යහපත්ය. දෙවියන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව සදාකාලික සත්‍යයන් තේරුම් ගැනීමට උන්වහන්සේ එමගින් ඔබට මඟපෙන්වනු ඇත.

**මෙම පොතෙහි පණිවිඩ සිව් වැදෑරුම් ලෙස සැළකිය හැක.**

*ඉතිරිය පිටු අංක 14, 15 බලන්න*




# පරිණාමවාදය

**පරිණාමවාදය**
**සියල්ලෝම අදහන බොරුව**
**බයිබලීය පිළිතුර**
**උත්පත්ති 1 වන පරිච්ඡේදය**



විද්‍යාඥයින් නොවන අප බොහෝදෙනා සිතා සිටින්නේ පරිණාමවාදය යනු වානරයා මිනිසා බවට පරිණාමය වීමේ තොරතුරු හැටියටයි. එහෙත් සත්‍යය එය නොවේ. පරිණාමවාදයේ පියා ලෙස සැලකෙන **චාල්ස් ඩාවින් (1802 - 1882)** තම මතය ඉදිරිපත් කරමින් රචනා කළ ප්‍රධාන අධ්‍යන ග්‍රන්ථය නම් "ස්වභාවික තොරාගැනීම කරණකොටගෙන වන ජීව විශේෂ වල ආරම්භය" "On the origin of species by means of Natural selection" වේ. එයින් ඉදිරිපත් කරන පරිණාමවාදයයේ මූලික හරය නම් සියලු ජීවී විශේෂ එකිනෙකට නෑදෑකම් ඇති බවත් එම සියලු ජීවී විශේෂ වලට පොදු මුතුන් මිත්තෙක් සිටින බවය. එහි සරල අරුත නම් අපට නෑදෑකම් ඇත්තේ වානරයාට පමණක් නොව ඌරා, බල්ලා, එළුවා යනාදී ඕනෑම සතෙකුටත් අඹ, කෙසෙල්, අන්නාසි, කරවිල, බංඩක්කා වැනි ඕනෑම ශාක වලටත්ය. මෙය කොපමණ හාස්‍යය ජනක යෝජනාවක් වුවත් දෙවියන්වහන්සේගෙන් තොර විශ්වයක් ගැන සිතන්නට ඇති කැමැත්ත නිසා ඉහත කී පරිණාමවාදය බොහෝ දෙනා විසින් වැළඳ ගන්නා ලදී. ඒ බොරුවේ පියාවන යක්ෂයා විසින් සිත් දූෂණය කර ඇති නිසාය. පාපය නැමැති වෛරසය මඟින් රෝගී වී ඇති සිත් මෙවැනි ව්‍යාජ මතවාදයන් ඉහළින් පිළිගෙන දෙවියන්වහන්සේගේ වැඩ සිටීමේ යථාර්තය අමතක කර දැමීමට උත්සාහ කරති. මෙහිදි ඔබ දැනගත යුතුම සත්‍යයක් නම් වර්තමාන විද්‍යාත්මක මතවාද අතරේ පරිණාමවාදය බිඳ වැටෙමින් තිබෙන බවය. මේ බිඳ වැටීම කඩිනම් වූයේ ජාන විද්‍යාවේ ප්‍රගතියත් සමඟය. පරිණාමවාදයට සාර්ථකව අභියෝග කල හැකි විවිධ විද්‍යාත්මක සත්‍යතාවයන් දැන් බොහෝසෙයින් සාකච්ඡාවට භාජනය වේ. ජාන විද්‍යාව හා ජීව රසායන විද්‍යාව නිසා පරිණාමවාදය තව දුරටත් දක්නා සාක්ෂි සහිත විද්‍යා ක්ෂේත්‍රයක් නොව විද්‍යා ප්‍රබන්ධ මතවාදයක් බවට පත් වෙමින් පවතී.

විශ්වයේ ආරම්භය හා පැවැත්ම පිළිබඳව සංෂිප්ත සත්‍ය තොරතුරු ඇත්තේ ශුද්ධ බයිබලයේ උත්පත්ති පොතේ පළවන පරිච්ඡේදයේය. **"පටන් ගැන්මේදී දෙවියන්වහන්සේ අහසත් පොළවත් මැවූසේක"** යන වගන්තියෙන් ශුද්ධවූ බයිබලය ආරම්භ වේ. එසේම ශුද්ධ බයිබලය එළිදරව් කෙරෙන දෙවියන්වහන්සේ කුමන ආකාරයේ කෙනෙක්ද? ශූන්‍යභාවයෙන් එකවරම විශ්වයේ සියලු පදාර්ථ ඇති කිරීමට හැකියාව ඇති කෙනෙකි. විශ්වය මැවීමට පෙර වැඩ සිටි කෙනෙකි. බයිබලය මඟින් අපට ප්‍රකාශ කරන්නේ සර්වඥ (සියලු දේ දන්නාවූ), සර්වව්‍යාපී (සෑම තැනම වැඩ සිටින), සර්ව බලධාරී (සියලු බලැති) තැනැන්වහන්සේ ලෙසය. එම තැනැන්වහන්සේ විසින් විශ්වයත් අප

පෘථිවියේ ඇති සියලුදේත් එකවර මැවූ බව ශුද්ධ බයිබලය ප්‍රකාශ කරයි. එය සිදු වූයේ එසේ නොව වෙනත් ආකාරයට යැයි කියන්නට පරිණාමවාදය අසාර්ථක උත්සාහයක යෙදේ.

## පරිණාමවාදයට එරෙහි සරල තර්ක කිහිපයක්.

**01.** පරිණාමවාදී විග්‍රහය තාප ගති විද්‍යාවේ පළවෙනි හා දෙවැනි නියමයන් හා සැසදෙන්නේ නැත. (First and second lows of Thermodynamics) ඔබ භෞතික විද්‍යාව අධ්‍යනය කරන්නෙක් නම් මේ ගැන කරුණු කාරණා සොයා බලන්න.

**02.** ජීවයෙහි ආරම්භය පිළිබඳ සාර්ථක අදහසක් පරිණාමවාදය මඟින් ඉදිරිපත් නොකෙරෙන අතර උපකල්පන පමණක් ඉදිරිපත් කරයි. සියල්ලට හේතුව "අහඹු" සිදුවීම් හැටියට ඉදිරිපත් කරයි.

**03.** පරිනාමවාදයෙන් යෝජනා කෙරෙන ජීවි විශේෂයන් හි වෙනස් වීම් වසර මිලියන ගණනක් තුල සිදු වූ දෙයක් ලෙස ඉදිරිපත් කරමින් අවුරුදු 80ක ජීවිත කාලයක් ඇති මිනිසාට නිරීක්ෂණය කළ නොහැකි දෙයක් ලෙස ඉදිරිපත් කරයි. වසර මිලියන ගණන් තර්කය දැන් බිඳ වැටෙමින් පවති. පොසිල පාෂණීය ධාතුවල වයස නිර්ණය කිරීමේ ක්‍රම වේදයන් පදනම් වී ඇත්තේ හරි හෝ වැරදි විය හැකි උපකල්පන මතය.

**04.** "දක්නට නොමැති පුරුක" දක්නට නොමැති පුරුකක් ලෙසම පවතී. වානරයා සහ මිනිසා වෙන වෙනම ජීවත් වන නමුදු ඒ දෙදෙනාගේ සම්මිශ්‍රණයක් වන අතර මැදි අවස්ථාවක කිසිම පිළිගත හැකි සාක්ෂියක් සොයා ගැනීමට නැත. එක සත්ව විශේෂයක් තව සත්ව විශේෂයක් බවට පරිවර්තනය වෙමින් යන බව නිරීක්ෂණය කර ගැනීමට හැකි කිසිම අතර මැදි පුරුකක් හමු වී නොමැත. පරිණාමවාදය සත්‍ය නම් එවැනි අතරමැදි පුරුක් ලක්ෂ ගණනින් නිරීක්ෂණය කිරීමට අපට හැකි විය යුතුය.

**05.** පුරුෂ සහ ස්ත්‍රී ලිංග වෙනස ඇතිවීම පිළිබඳව පරිණාමවාදය කිසි හේතුවක් ඉදිරිපත් කළ නොහැක.

**06.** සෙල විපර්යාසය හැම විටම ජීවියකුට අහිතකරය. සෙල විපර්යාසයක් වීමෙන් වඩා හොඳ ජීවියකු නිර්මාණය වනු අපට නිරීක්ෂණය කළ නොහැකිය. සෙල විපර්යාස මඟින් පිළිකා රෝගය හටගනී. පරිණාමවාද සත්‍ය වීමට නම් සෙල හෝ ජාන විපර්‍යාසය මඟින් වඩා හොඳ ජීවියකු නිර්මාණය විය යුතුය. නමුත් එය එසේ සිදු නොවේ.

**07.** සියලු ජීවි විශේෂයන් වෙන වෙනම එකමවිට ජීවත් වෙමින් පවති. පරිණාමවාදී මතයන්ට දෙවියන්වහන්සේ පිළිතුර උත්පත්ති පළමු පරිච්ඡේදයේ සඳහන් වේ. සත්ව විශේෂයන්ගේ සිදුවිය හැකි වෙනස් වීම් පාලනය වන නීතිය දෙවියන්වහන්සේ එහි සඳහන් කර තිබේ. **උත්පත්ති 1:11,12,21,24 වැනි පදයන්හි "ඒ ඒ වර්ග ලෙස"** යනුවෙන් සඳහන් වේ. එසේ නම් නිශ්චිත සත්ව පවුලකින් ඔබ්බට ගමන් කිරීමට කිසි ජීවියකුට නොහැකිය. බළල් පවුලේ සත්වයකු වෙනස් විය හැක්කේ ඒ පවුල තුල පමණක් බව දෙවියන්වහන්සේ නියම කොට තිබේ. බළල් පවුලේ සත්වයකු අශ්ව පවුලට මාරු විය නොහැක. "ඒ ඒ වර්ග ලෙස" දෙවියන්වහන්සේගේ නියමයයි.

**"සියලු මනුෂයන් බොරුකාරයන් වුණත් දෙවියන්වහන්සේ සැබෑ බව පෙනේවා" (රෝම 3:4).**

මතු සම්බන්ධයි

**- නෙවිල් ජයසුන්දර -**

පිටු අංක 11 න් ........

පළමුව පුරුෂයෙකු සහ ස්ත්‍රියක් අතරේ තිබිය යුතු වූ දෙවියන්වහන්සේ විසින් නියම කරනු ලැබූ පිරිසිදු විවාහක ප්‍රේමයේ ප්‍රකාශනයක් ලෙස මෙය සැළකිය හැක. එය සාලමොන් සහ ෂුලම්මීය ස්ත්‍රිය අතර ප්‍රේම කතාවයි. වර්තමාන කාලය පිරිසිදු විවාහක ප්‍රේමයට යකෂයා විසින් තදබල පහර එල්ල කරන කාලයක් යැයි සැළකීම වැරදි නොවේ. දුෂ්ට සහ ලෞකික සිතුවිලිවලින් ස්ත්‍රී පුරුෂ අයගේ මනස බොහෝ දුරට දූෂිත වී ඇත. බොහෝ පවුල්වල සමාදානය බිඳී ඇත්තේ මේ හේතුවෙනි. ශුද්ධ විවාහ බන්ධනය දෙවියන්වහන්සේ විසින් ස්ථාපිත කළ එකක් බව ඇදහිලිවන්ත අප දැනගත යුතුය. ඒ එකිනෙකා වෙතට දෙවියන්වහන්සේගේ ප්‍රේමය පෙන්වීමේ අරමුණින් යුතුවය. ඇතැම් යුවල් එකිනෙකාට ප්‍රේමකරන්නේ විවාහ ජීවිතයේ ආරම්භක කාලසීමාවේදී පමණය. ඉන්පසු එකිනෙකාට සැරපරුෂ ලෙස කතාකරමින්, එකිනෙකා සමඟ ගැටුම් ඇතිකර ගනිති. මේ හේතුවෙන් ඔවුන් අධෛර්යයට පත්වී යේසුස්වහන්සේ අනුගමනය නොකරති. මෙය කියවන සියලුම විවාහක සහෝදරියන් තමාගේ විවාහ මංගල්‍යයේදී දෙවියන්වහන්සේ ඉදිරිපිට දෙනු ලැබුවාවූ පොරොන්දු ගැන යලි සිහිකර සිත් සෝදිසි කරගන්නා මෙන් ඉල්ලන්නට කැමැත්තෙමි. අපගේ ස්වාමි පුරුෂයන්ට ප්‍රේමකොට යටත්ව සිටින්ට අපි පොරොන්දු වුනෙමු. එසේ නොකිරීම ගැන කිසියම් හෝ නිදහසට කාරණාවක් දෙවියන්වහන්සේ පිළිනොගනු ඇත. අපි දිව්‍ය ප්‍රේමය දෙවියන්වහන්සේගෙන් උගෙන අප ස්වාමිපුරුෂයන්ට දැක්විය යුතුයි. මේ අනුව සාලමොන්ගේ ගීතිකා පොතේ පළමු අර්ථ කථනය නම් පාරිශුද්ධ විවාහක ප්‍රේමයයි.

දෙවනුව සාලමොන්ගේ ගීතයෙන් තම ගිවිසුමේ ජනතාව වන ඉශ්‍රායෙල්ට ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමයයි. බයිබලයෙහි ස්ථාන කීපයක් **"ස්වාමීන්වහන්සේගේ භාර්යාව"** ලෙස ඉශ්‍රායෙල් හඳුන්වා දී ඇත. ස්වාමින්වහන්සේ ස්වාමි පුරුෂයා ලෙස නම් කොට තිබේ. කරුණාකර **යෙසායා 54:5 සහ 6 බලන්න. "කුමක්හෙයින්ද නුඹේ ස්වාමි පුරුෂයා නම් නුඹේ මැවුම්කාරයාණෝය; උන්වහන්සේගේ නාමය සේනාවල ස්වාමීන්වහන්සේය. නුඹේ මිදුම්කාරයාණෝ ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනැන්වහන්සේය. මුළු පොළොවේ දෙවියන්වහන්සේයයි උන්වහන්සේට කියනු ලැබේ. මක්නිසාද අත්හරින ලද්දාවූ, ආත්මයෙහි ශෝකය ඇත්තාවූ භාර්යාවක් මෙන්ද, පහකරන ලද යෞවන කාලයේ භාර්යාවක් මෙන්ද ස්වාමීන්වහන්සේ නුඹ කැඳවා ගත් සේකැයි නුඹේ දෙවියන්වහන්සේ කියන සේක" (යෙරමියා 2:2) සහ (එසකියෙල් 16:8-14)** එම අදහසම සඳහන් වේ. මේ නිසා සාලමොන්ගේ ගීතිකාව කියවන විට අපට සිහිවන්නේ දෙවියන්වහන්සේ සහ ඉශ්‍රායෙල් අතර ඇති සම්බන්ධතාවයයි. සෑම විටම දෙවියන්වහන්සේට අවශ්‍ය වුනේ ඉශ්‍රායෙල් සමඟ ඉතා සමීප සහභාගීකමක් පැවැත්වීමටයි. **"නුඹලා මට අසහාය වස්තුවක් වන්නහු"** යයි **නික්මයාම 19:5 හි** උන්වහන්සේ පවසන්නේ මේ නිසාය. ඉන්පසු **"මා ඔවුන් මධ්‍යයේ වාසය කරන පිණිස**

**ඔවුහු මට ශුද්ධස්ථානයක් සාදත්වා" යි නික්මයාම 25:8** හි උන්වහන්සේ පවසනසේක. මේ නිසා දෙවැනි අර්ථ කතනය වනුයේ ඉශ්‍රායෙල් ජනතාව සමඟ ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේම කතාවයි.

තුන්වෙනුව මෙම පොතෙන් සංකේතවත් වන්නේ තම ස්වර්ගික මනාලිය වන සභාව කෙරෙහි ඇත්තාවූ ස්වාමිවූ යේසුස්වහන්සේගේ ප්‍රේමයයි. මෙතෙක් කියනු ලැබූ ශ්‍රේෂ්ඨතම ප්‍රේම වෘතාන්තය එයයි. **2 කොරින්ති 11:2** කියවන්න. " **මක්නිසාද පිරිසිදු කන්‍යාවකු මෙන් නුඹලා ක්‍රිස්තුස්වහන්සේ වන එක පුරුෂයෙකුට පාවාදීම පිණිස මා විසින් විවාහ බස් දුන් බැවින් දිව්‍යවූ ජ්වලිතයකින් නුඹලා ගැන මම ජ්වලිතව සිටිමි".** මෙය ශුද්ධ ලියවිලි තුලින් අපට ඉගෙන ගත හැකි ශ්‍රේෂ්ට තේමාවකි. සාලමොන්ගේ ගීතය කියවන සෑමවිටකම එහි සඳහන් ප්‍රේම වෘතාන්තය හරහා හෙළිදරව් වන්නේ තම සභාව කෙරෙහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය බවයි. වර්තමානයේ තම ස්වර්ගික මනමාලයා පැමිණෙන තුරු සභාව මඟබලා සිටී. අප සියලු දෙනාද බලා සිටින්නේ සභාව ඔසවා ගැනීම කවදා සිදුවේද යන ප්‍රාර්ථනාවෙන් යුතුවය. මතක තබාගන්න, මනාලිය ගැන කතා කිරීමේදී ප්‍රධාන විෂය වන්නේ ඇගේ පිවිතුරු භාවයයි. ලෝකයේ පිළිවෙත් මඟින් අපවිත්‍ර නොවන්නැයි දෙවියන්වහන්සේ අපට සිහිපත් කරන සේක. **(යාකොබ් 1:27, රෝම 12:2).**

මීළඟට සාලමොන් ගීතිකාවේ සතරවෙනි අර්ථකතනය කුමක්දැයි බලමු. අප එකිනෙකා පුද්ගලික ලෙස ක්‍රිස්තුස් යේසුස්වහන්සේ සමඟ ඇති සමීප සම්බන්ධතාවයද මේ ගීතයෙන් පිළිබිඹු කරයි. ස්වාමීවූ යේසුස්වහන්සේ සමඟ ඇත්තාවූ අපගේ සම්බන්ධතාවය අත්‍යවශ්‍යයෙන්ම ප්‍රේම සම්බන්ධතාවයකි. එය බිය හෝ අන් ආකාර තත්වයක් පදනම් කරගෙන නොව ප්‍රේමය පදනම් කරගත් සම්බන්ධතාවයකි. දෙවියන්වහන්සේ සදාකාලික ප්‍රේමයකින් අපට ප්‍රේමකොට තිබේ. එය **යෙරමියා 31:3** හි සඳහන්ය. මීළගට **යොහාන් 3:16** හි පැවසෙන්නේ **"තම ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම්"** උන්වහන්සේ අපට ප්‍රේම කල බවයි. තවද **එපීස 5:25 හි, "ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේමකොට එය උදෙසා තමන්ම පාවාදුන් බව"** සඳහන් වේ. එසේනම් මෙය මුලුමනින්ම දිව්‍ය ප්‍රේමය පිළිබඳව සංකේතාත්මක කතාවකි.

මාංසික සිතක් ඇත්තාවූ කෙනෙකුට සාලමොන්ගේ ගීතිකා පොත නිවැරදිව තේරුම් ගත නොහැකිය. අලුත් ඉපදීම නොලත් කෙනෙකුට මෙම පොතෙහි ඇති දිව්‍ය සැලැස්ම නොපෙනේ. ඔවුන් දකින්නේ මිනිස් ප්‍රේම කතාවක් පමණි. එහෙත් ඇදහිලිවන්ත අප සාලමොන්ගේ ගීතිකාව තුලින් දිව්‍ය ප්‍රේමය සහ දිව්‍ය සත්‍යතාවයන් දකිමු.

මතුසම්බන්ධයි.

**- ඈන් ජයසුන්දර -**



# ඇස්



මෑතකදී අහම්බෙන් මෙන් රූපවාහිනී දර්ශනයක් නැරඹීමේදී ගිනස් ලෝක වාර්ථාවක් මගේ ඇස ගැටුනා. ලෝකයේ සිදුවන විලම්භිත අතර තවත් එවන් ජවනිකාවක් දුටු මගේ ඇස් රවුම් බෝල දෙකක් බවට පත් වුනේ නිරායාසයෙන්. කටින් කිරි උරා එය ඇසකින් අඩි ගණනාවක් ඈතට විද ලෝක වාර්ථාවක් තැබූ පුද්ගලයෙක් ! පුදුමයි ඒත් ඇත්තයි ! එහෙත්, .... ඇස් තිබෙන්නේ එවැනි හිරිකිත ශිල්ප දැක්වීමට නම් ඇස් නැතිව සිටීම වඩා යහපත් බව මට එවලේ හැඟී ගියා.

ඇස් ! මිනිසාගේ පන්චේන්ද්‍රියයන් අතර ඉතාම සංවේදී ඉන්ද්‍රියක් වන එය දෙවියන්වහන්සේගේ මැවිල්ලේ ඉතාම සියුම්කම කියාපාන අපූරු සාක්ෂියක්.

ඇස් නැතිව කැඩපතක් දෙස බලන මිනිසා දත් නැතිව බත් කන මිනිසාට වඩා අඥානයෙක්. එසේ නැත්නම් දෙපා නැතිව මැරතන් දිවීමට මානබලන මානසික රෝගියෙකි. ආත්මික ඇස් නැතිව ගත කරන කිතුණු දිවියද ඒ හා සමාන අර්ථ ශූන්‍ය එකකි. ශරීරයේ පහන නම් ඇස බව යේසුස්වහන්සේ පැවසූසේක. **"යමෙකුගේ ඇස නපුරු නම් ඔහුගේ මුලු ශරීරය අඳුරු වන්නේය" (මතෙව් 6:22).** ආත්මික ඇස් වඩාත් තිර වීමට අදාල කාරණා සෙවීම කාලෝචිතය. එනම්,

★ නිරන්තරයෙන් දේව වචනය කියවා එය මෙනෙහි කිරීම.

★ දෙවියන්වහන්සේට සියල්ලේදී ප්‍රශංසා කිරීමේ දිවියක් ගත කිරීම.

★ නොකඩවා යාච්ඤා කිරීම.

★ අනෙකුත් ඇදහිලිවන්තයින් සමඟ නිතර සහභාගීකම් පැවැත්වීම.

★ ශුභාරංචිය ගැන අනෙක් අයට ප්‍රකාශ කිරීම (සාක්ෂි දැරීම).

★ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟ පෙන්වීම යටතේ වූ ජීවිතයක් ගෙවීම යනාදියය.

යථෝක්ත කාරණා නිරන්තරයෙන් සහ බහුල වශයෙන් පිලිපැදීමට උත්සහ කිරීම තුලින් අපගේ ආත්මික ජීවිතය තියුණුවේ. බොහෝ අය ඉහත සඳහන් කාරණා එකක් හෝ දෙකක් පමණක් කිරීමට උත්සහ කිරීමෙන් සෑහීමට පත්වෙති. ඒ අය කිතුණු දිවිය දැකීමට උපැස් පැලදිය යුතුවෙයි. අවශ්‍ය වන්නේ සෑම කිතුණු ප්‍රතිපත්තියකටම සමබර

සම්මිශ්‍රණයකි.

සමහර අය උකුසු ඇසින් ඈත බැලීමට ගොස් ලග තිබෙන කානුවේ වැටී අතපය කඩා ගනිති. දුර දිග බැලීම හොඳය. එහෙත් ලග නොබලා දුර බැලීමට යෑම දුර දක්නා නුවණටද කරන නින්දාවකි. තමා ලග තිබෙන තමාගේ ඇසේ පොල්පරාල නොසලකා ගව්ගානක් ඈත සිටින කෙනාගේ රොඩ්ඩ තමන්ට ඇස් රුදාවක් සේ දැනීමත් මේ හා සමානයි. ඇස් ඇති අය **මතෙව් 7:3-5** කියවන්න.

"මොකද බලන්නේ" යමෙක් අසයි. "ඉදා .... ඇස් තියෙන්නේ බලන්නනේ" අනෙකා විදුලි වේගයෙන් පිළිතුරු දෙයි. ඉන් ඉක්බිත්තේ දඩිබිඩි ගා අන්‍යෝන්‍ය ලෙස හුවමාරු වෙන ගුටිකෙලිය කෙලවර වන්නේ කෙනෙක් ඇස් වාට්ටුවේද අනෙකා දත් වාට්ටුවේද නවාතැන් ගැනීමෙනි. ඇස් තිබෙන්නේ තමන්ට යුතු අයුතු හැම දේම බැලීමට නම් නොවේ. "නුඹේ බැල්ම ගැන ප්‍රවේශම් වෙයන්" යන සංගීතය කුඩාකල පටන්ම ළමයින්ට කටපාඩම් කරවීම ඉතා ප්‍රඥාගෝචර බව ප්‍රත්‍යක්ෂ වන්නේ එසේ නැතිව හැදෙන වැඩෙන අය ඉහත කී ඇසේ වලිප්පුවෙන් නොබේරෙන නිසාය. නුඹේ ඇස නුඹට බාදා කෙරේ නම් එය උගුලා දමාපන්න. ඇස් දෙකක් ඇතිව නිරාගි න්නට හෙලනු ලැබීමට වඩා එක ඇසක් ඇතිව ජීවනයට ඇතුල් වීම යහපත් යයි යේසුස්වහන්සේ කීසේක **(මතෙව් 18:9)**. ලෝකයේ පාපය පටන් ගැන්මේ පළමුවැනි ජවනිකාවට මුල් වුනේ ඇස් බව කාටත් අමතක නොවන්නේ එදා උයනේදී.... භාර්යාවට අවනත වූ මුල්ම මිනිසා වන ආදම්ව සිහිවන විටය. ක්ෂණිකයකින් පාපය ලොවට ඇතුල් විය. ඒ පාපයේ කුලිය මරණය වේ. **(රෝම 6:23)** මහා සූරවීර සම්සොන්ද ඇස් තෘෂ්ණාවෙන් දෙලිලා පසුපස ගොස් අවසන් ජවනිකාවට පෙර තමාගේ ඇස් දෙකද පොට්ට කර ගත්තේය. ආදම් සහ ඒව විශ්වාස කලේ තහනම් ගහෙන් කෑමෙන් ඔවුන්ගේ ඇස් ඇරෙන බව වුවත් සිදුවුනේ ඔවුන් ආත්මික අන්ධයින් බවට පත්වීමය.

ඇස් නොපෙනෙන අයට කියන්නේ අන්ධයින් කියලාය. අන්ධයෙක් තවත් අන්ධයෙකුට මගපෙන්වන්නට යෑමේ දර්ශණය හදවත කම්පා කරවයි. මේලෝ විවිධ ආගම්, දර්ශණ (දේශපාලනයද ඇතුලුව) හා වෙනත් ඇස් බැන්දුම්වල පිළිසරණ පතා යන මනුෂ්‍යයාගේ තත්වයද මෙයට දෙවැනි නැත. සියලුම ආගම් හා දර්ශනවල කතෘන්ද අන්ධයින්ය. තුමූම අන්ධයින්වී අනික් අයට ඔවුන් මගපෙන්වන්නේ කොහොමද? බිරෙල් ක්‍රමයටද? එහෙත් පාපයෙන් ගැලවීමට බිරෙල් ක්‍රමයක් නැත. එකම මාර්ගය වූ යේසුස්වහන්සේ **"මාර්ගයද සැබෑවද ජීවනයද මම වෙමි"** යි කීසේක. උන්වහන්සේව ඔබගේ ගැලවුම්කාරයා ලෙස පිළිගෙන සම්පූර්ණ පවිකමාව ලබා අලුත් මැවිල්ලක් බවට පත්වී උන්වහන්සේ සමග අලුත්ම ජීවිතයක් අරඹන්න. එසේ අරඹන දිවිය ඔබ ඔබේ දෑස් යේසුස්වහන්සේ වෙතම

යොමු කරමින් ගමන් කරන්නේ නම් පේත්‍රුස් මෙන් අවට කුණාටු දැක බිය විය යුතු නැත. ජීවමාන යේසුස්වහන්සේ අපගේ මඟපෙන්වන්නාය.

එකිනෙකාට මඟපෙන්වීමට උත්සාහ කරන අන්ධයින් දෙදෙනාට වඩා හාත්පසින්ම වෙනස් අන්ධයින් දෙදෙනෙක් **මතෙව් 9:27-31** කියවීමේදී මුණගැහේ. ඔවුන් දෙදෙනාම එකට එක්ව යේසුස්වහන්සේ පසුපස ගොස් ඇස් පෙනීම ලැබූහ. මෙසේ උන්වහන්සේගේ දරුවන් බවට පත්වන අපව යේසුස්වහන්සේ ඇසේ කළුරුව මෙන් රැකගන්නා සේක.
පූසා කිරි බොනවිට ඇස් පියාගන්නේ අවට අන්ධකාරය නිසා කිසිවෙකුට තමන් නොපෙනෙන බව සිතා විය හැකිය. පව්කිරීමට ආශා කරන අයද ආලෝකයට වඩා අඳුරට කැමති වන්නේ තමන්ගේ පාපය රහසිගතව තබා ගැනීමටය. එහෙත් දෙවියන්වහන්සේ ඉදිරියේ ප්‍රකාශ නුවූ කිසි මැවිල්ලක් නැත. උන්වහන්සේගේ ඇස් ඉදිරියේ සියල්ල වැස්මක් නැතිව ඇරී තිබේ. **(හෙබ්‍රෙව් 4:13)**

කාන්තාවන්ගේ කාන්තිමත් ඇස් ගැන කවියන් විසින් විචිත්‍රාකාරයෙන් වනාතිබේ. දිගු ඇස් තිබූ පමණින් ඇස් ලස්සන නොවේ. චීනුන්ගේ ඇස් දිගු වුවත් අලංකාර නැත. සමහරුන් ඇස් කොනින් කොමල ලෙස බලන්නේද තමන් තවත් ලස්සන වෙන බව සිතා විය හැකිය. එහෙත් ඒ බැල්මට අසුවන පුද්ගලයා බිලිපිත්තට අසුවන මාලුවාටත් වඩා අසරණ වේ. හොර ඇසින් බැලීමද එවැනි ඇස් කොනින් බැලීමක් වන අතර එයින් සිතේ තිබෙන අවලක්‍ෂණ හෙළි වේ. දිගු ඇස් වුවත් රවුම් හෝ හතරැස් වුවත් එයින් කෙනෙකුගේ ලක්‍ෂණ තීරණය නොවේ. බොහෝ අයට දිවැස් බැලීමේ හැකියාවද තිබේ. බොහෝ විට අනෙක් අයගේ සිතේ තිබෙන කහට ගැන දිවැස් හෙලා අනුමාන කරමින් තමන්ගේ සිතේ කහටක් ඇති කර ගැනීම ඇස් අදහාගත නොහැකි එහෙත් සත්‍ය කරුණකි.

ලොව සිටින බලවත් දුබල සෑම දෙනාගේම දෑස් යොමු කළ යුතු එකම දසුන කුරුසිය මත එල්ලී සිටින දේව කුමරුන් වන යේසුස්වහන්සේය. උන්වහන්සේ දෑස් උතුරා යන ප්‍රේමයෙන් හා කරුණාවෙන් ඔබ වෙත බලා සිටිනසේක. ඔබේ දෑස් උන්වහන්සේ වෙත යොමු කරන්න. එවිට ඔබට ගැලවීම ලැබේ.

අවසාන වශයෙන් කිතුණු සභාව යේසුස්වහන්සේගේ නැවත පැමිණීම ගැන ඇස් නොපියා අහස දෙස බලා සිටිය යුතු කාලය එළඹ තිබේ. සැබෑ ලෙස ගැලවීම ලබා දෙවියන්වහන්සේගේ දරුවන්, යේසුස්වහන්සේගේ මහත් ප්‍රකාශ වීමේදී ඇසි පිය හෙළණ ක්ෂණයකින් වෙනස් වී අහසට ඇදගනු ලබන්නේය. ඔබත් සූදානම්ද?

**- ඇලෙක්ස් පෙරේරා -**




# නැවත උත්පාදනය ලැබූ අයකු සතු සත් ප්‍රකාර සදාකාලික ස්වර්ගික සහතිකභාවය

**යොහාන් 3** වන පරිච්ඡේදයේ සඳහන් වන යේසුස්වහන්සේ හා නිකදේමුස් අතර සිදු වූ කතාබහේදී නැවත ඉපදීම ලැබීමට අවශ්‍ය බව උන්වහන්සේ නිකදේමුස්ට අවධාරණය කල අතර ඉන් පසු ඔහුට ලැබෙන දේ පිළිබඳවද සඳහන් කල සේක.

## 01. සදාකාලික ප්‍රේමය යොහාන් 3:16

**"දෙවියන්වහන්සේ .... ලෝකයාට ප්‍රේමකළ සේක"**

ලෝකයේ සිටින සියලු මිනිසුන්ට දෙවියන්වහන්සේ ප්‍රේම කරන අතර ඊට ඔබත් මාත් අයිතිය. නමුත් **රෝම 3:23** පවසන පරිදි සියල්ලෝම පව්කාරයන්ය. එසේ තිබියදීම උන්වහන්සේ අප එකිනෙකාට ප්‍රේම කරනසේක. තම පාපය පිළිබඳ පසුතැවිලි වී යේසුස්වහන්සේ අදහගන්නා කවුරු නමුත් එම ප්‍රේමය සැබෑ අයිතිකරුවන් බවට පත්වේ. දෙවියන්වහන්සේගේ සදාකාලික ප්‍රේමය භුක්තිවිඳීමට හැකි වන්නේ නැවත ඉපදීම ලැබූ කිතුණු ජනතාවටයි. එහෙත් ඕනෑම අයකුට එම අයිතිවාසිකම යේසුස්වහන්සේ අදහාගැනීමෙන් නොමිලේම ලබා ගත හැකිය.

## 02. සදාකාල රාජ්‍යය යොහාන් 3:5

**"යමෙක් අලුතෙන් නූපන්නොත් දෙවියන්වහන්සේගේ රාජ්‍යය දකින්ට නොහැකියයි... උන්වහන්සේ කීසේක"**.

මනුෂ්‍යාගේ සිතේ කල්පනාවල් හැම විටම ඇස් වලින් දකින රාජ්‍යයන් පිළිබඳවය. එනම් මේ පොළොව මත ඇති දේශපාලනමය රාජ්‍යත්‍රාන්තික රාජ්‍යයන් කෙරෙහිය. එහෙත් ඇසට නොපෙනෙන බයිබලය ප්‍රකාශ කරන ආත්මික, රාජ්‍යයක් තිබේ. එය සදාකාලික ස්වර්ගික රාජ්‍යයක්ය. මිනිසුන් මරණින් පසු යන තැන් දෙකකි. එකක් නිරය නොහොත් අපාය. අනෙක ස්වර්ගය නොහොත් දිව්‍ය ලෝකයය. ස්වර්ගයට යා හැක්කේ නැවත ඉපදීම ලැබූ අයට පමණක් බව පැහැදිලිව හා ස්ථිරවම බයිබලය ප්‍රකාශ කරයි.

## 03. සදාකාල පූජාව යොහාන් 3:16

**"තම ඒක ජාතක පුත්‍රයාණන් දෙන තරම් ....."**

දෙවියන්වහන්සේම යේසුස්වහන්සේ නමින් මාංශවත් වී එනම් මිනිසකු ලෙස මෙලොව ඉපදීම සිදු වූයේ මහත් සදාකාලික යාගයක් ඔප්පු කිරීම පිණිසය. එනම් මනුෂ්‍ය සංහතියේ පාපයේ වන්දි මිලය ගෙවා අවසන් කිරීමටය. අතීත,

වර්තමාන, අනාගත යන සදාකාලයට එකම පූජාවකි. යේසුස්වහන්සේ තම පාපයේ වන්දිය ගෙවූ ගැලවුම්කරුවා ලෙස අදහාගන සැමදෙනාම පාපයෙන් ගලවනු ලබනවා පමණක් නොව කිසිම පාපයක් නොකරපු අය ලෙස පිළිගනු ලබයි. නැවත ඉපදීම ලැබූ අය පාපයෙන් සදාකලයට නිදහස්ය. ඔවුන් පවිත්‍රය, ශුද්ධය.

## 04. සදාකාල ජයග්‍රහණය යොහාන් 3:14 හා 15

**"කාන්තාරයේදී මොසෙස් සර්පයා එසවූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද ඔසවනු ලබන්ට ඕනෑය..."**

**"පාපයේ කුලිය නම් මරණයය" රෝම 3:23.** එහෙත් යේසුස්වහන්සේ පාපයේ වන්දිය ගෙවා මරණය ජයගත් සේක. එය එසේ කලේ ඔබ, මා හා මුලු මනුෂ්‍ය සංහතිය උදෙසාය. එමෙන්ම උන්වහන්සේ මරණින් පසු තුන්වෙනිදා එම ශරීරය මළවුන්ගෙන් නැගිටුනු සේක. නමුත් උන්වහන්සේ නැවත කිසි දිනක මරණයට පත් නොවුන සේක. එයද විශාල සදාකාලික ජයග්‍රහණයකි. අද නැවත ඉපදීම ලැබූ අයට ද මෙම ජයග්‍රහණයට හිමිකම් ඇත. ඔවුන්ද තම මරණයෙන් පසු නැගිටින්නේය.

## 05 සදාකාල ජීවනය යොහාන් 3:16 / යොහාන් 5:15.

**"උන්වහන්සේ කෙරෙහි අදහන සැමදෙන විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය".**

සදාකාල ජීවනය හෝ අමාමහා ජීවනය යනු මනුෂයකුගේ ශාරීරික මරණයෙන් පසු මනුෂ්‍ය ආත්මය විනාශ නොවී යහපත් තැනකට ගොස් ජීවත්වීමයි. මෙහි විරුද්ධ අදහස නම් සදාකාල විනාශයයි. ආත්මය වේදනාකාරී තැනකට ගමන් කොට සදාකාලයට දුක් විදිමින් ජීවත් වීමයි. නමුත් නැවත ඉපදීම ලැබූ අයගේ ආත්මය ශාරීරික මරණයේදී ශරීරයෙන් වෙන්ව ස්වර්ගය වෙත ගමන් කරන අතර, ශරීරය භූමදානය හෝ ආදාහනය කිරීමෙන් පසු ඉතිරිවන මූලද්‍රව්‍ය නැවත පසට එකතු වෙයි. නමුත් යේසුස්වහන්සේ නැවත එන දවස එම ශරීරයද නැවත නැගිටියි. **(1 තෙසලෝනික 13-18)** බයිබලීය විශ්වාසය හා සහතිකය වන්නේ නැවත ඉපදීම ලැබූ අයගේ ආත්මයට පමණක් නොව ශරීරයට ද සදාකාල ජීවනය උරුම බවයි. දෙවියන්වහන්සේටත් යේසුස්වහන්සේටත් ප්‍රශංසා වේවා!

## 06. සදාකාල විනිශ්චය යොහාන් 3:18

**"උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා විනිශ්චය කරනු නොලැබේ".**

මනුෂයකුට මරණයෙන් පසු මුහුණ දීමට තිබෙන ඉතාමත් භයන්කර අත්දැකීමක් වන්නේ අහස, පොළව මැවූ එය පාලනය කරන සර්වබලධාරී දෙවියන්වහන්සේගේ විනිශ්චයට මුහුණ දීමය. තම තමා ජීවිතය කාලය තුලදී කල ක්‍රියාවන් පිළිබඳ (පව් - පින් ගණන් බැලීම) විනිශ්චයේදී ගණන් බැලීමක් සිදු කරයි. **(හෙබ්‍රෙව් 9:27).** බයිබල පුරාවටම විනිශ්චය දවස

පිළිබඳ අනතුරු අඟවයි. **"මළාවූ ලොකු අයද, කුඩා අයද සිංහාසනයේ ඉදිරියෙහි සිටිනවා දුටිමි. පොත් ද දිගහරිනු ලැබුවේය. ජීවන - පොත වන තවත් පොතක් දිගහරිණු ලැබුවේය මලාහු තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියනලද දේවලින් විනිශ්චයය කරනු ලැබුවේය" (එළිදරව් 20:12).** නැවත ඉපදීම ලැබූ මනුෂ්‍යයන් විනිශ්චයෙන් නිදහස්ය. ඔවුන් යේසුස්වහන්සේගේ මරණය, තැන්පත් කිරීම, නැවත නැගිටීම විශ්වාස කිරීම කරණකොටගෙන ධර්මිෂ්ඨකොට ගණන් ගනු ලැබූ හෙයින් ඔවුන්ට විනිශ්චයක් නැත. අන් අයට විනිශ්චයෙන් පසු තිබෙන්නේ දඬුවම නියම කිරීම හා දඬුවමට පත් කිරීමයි.

## 07. සදාකාල දඬුවම යොහාන් 3:19 (වරදට පත්කිරීම)

**"විනිශ්චය නම් මේය, ලෝකයාට ආලෝකය පැමිණ තිබෙන නමුත් මනුෂ්‍යයන්ගේ ක්‍රියා නපුරු බැවින් ඔවුන් ආලෝකයට වඩා අන්ධකාරයට ඇලුම් බවය".**

මනුෂයන්ගේ විනිශ්චයෙන් පසු ඔවුන් දඬුවම නිම කිරීම නොහොත් විනිශ්චය ප්‍රකාශ කිරීම සිදුවේ. අද අධිකරණයේදී ද මෙය සිදු වේ. නඩු විභාග අවසානයේදී තීන්දුව ප්‍රකාශ කරයි. එනම් දඬුවම නියම කරයි.

**"යමෙකුගේ නම ජීවන පොතෙහි ලියා නැති බව සම්බවීද ඔහු ගිනිවිලට හෙළනු ලැබේ".**

දඬුවම් කරන ස්ථාන දෙකකි. වර්තමානයේදී දඬුවම ලෙස නිරරයට නොහොත් අපායට මනුෂ්‍යයාට යාමට සිදු වේ. ඉන්පසු මුලු නිරයත්, සාතන්වත් විනිශ්චයේදී ගිනිමුහුද නොහොත් ගිනි විලට හෙළයි. එහිදි යක්ෂයා සහ ඔහුගේ දූතයන්ද ගිනිවිලට හෙලනු ලැබේ. ඉන් පසු එය මුද්‍රා කරනු ලබන අතර එහිදී විදීමට තිබෙන දුක, වේදනාව, ගාවිනාව හා දත්මිටි කෑම බයිබලය මනාව ප්‍රකාශ කරයි. නැවත ඉපදීම ලැබූ අයට දඬුවමට පත් කිරීමක් නැත.



මෙහි සඳහන් බයිබලීය සත්‍යතාවයන් ඔබත් විශ්වාස කර නැවත ඉපදීම ලබා ජීවිතය අලුත් කරගෙන ඔබත් සදාකාලික යහපත නොහොත් අමාමහා සැපත පිළිබඳ සහතිකභාවයක් සහිත ජීවිතයකට ඇතුලුවන්න.

**- ගුරුහරු -**




# උන්වහන්සේ මෙහි නැත (මතෙව් 28:6)

ඉහත සඳහන් පණිවිඩය ලැබුනේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව සොයාගෙන ආ ස්ත්‍රීහු කිහිප දෙනෙකුටයි. හරියටම කියනවානම් මැරුණාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය බලන්නට සොහොන්ගෙට පැමිණි ස්ත්‍රීන් හට දේවදූතයකු විසින් දෙනු ලැබුවාවූ පිළිතුර මෙයයි. " **උන්වහන්සේ මෙහි නැත, උන්වහන්සේ කී ලෙසම නැගුටුණුසේක. වරෙල්ලා ස්වාමීන්වහන්සේ උන් ස්ථානය බලා ඉක්මණින් ගොස් උන්වහන්සේ මළවුන්ගෙන් නැගුටුණු සේක කියා උන්වහන්සේගේ ගෝලයන්ට කියාපල්ලා" (මතෙව් 28:6-7).** අදද ඔබ සෑමදෙනා වෙතටම අප විසින් දෙන්නට ඇති පණිවිඩයත් මෙයමයි. "**උන්වහන්සේ නැගුටුණුසේක, උන්වහන්සේ ජීවත්ව සිටිනසේක**" ඔව් අප විසින් ප්‍රකාශ කරන්නේ මැරුණු ගැලවුම්කරුවකු නොවේ. එහෙත් දැන් ජීවමානව වැඩ වාසය කරන ගැලවුම්කරුවාණන් වහන්සෙයි.

ඉහත සඳහන් අවස්ථාවේ ස්ත්‍රීවරු පැමිණියේ මැරුණාවූ ශරීරයකට සුවඳලාටු ආලේප කරන පිණිසයි. මලාවූ කෙනෙකුට ගෞරව කරන පිණිසයි. අද පවා මනුෂ්‍යයින් කරන්නේ මෙයයි. ඔව්හු ජීවතුන් අතර නැත. ඔවුහු විසින් කියාදුන් ඉගැන්වීම් අනුගමනය කරන්නට මනුෂ්‍යයින් හට උදව්වීමටවත් හැකියාවක් ඔවුනම නැත. මක්නිසාද ඔව්හූ මැරිලා ගොසින්ය. එහෙත් ජීවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පමණක් මළවුන්ගෙන් නැගිටසිටිනසේක.

## යේසුස්වහන්සේගේ ලොව පහලවීම.

යේසුස්වහන්සේට පොළොවේ පියෙක් සිටියේ නැත. උන්වහන්සේ මරියාගේ කුසේ පිළිසිඳුනේ ශුද්ධාත්මයාණන් කරණකොටගෙනයි (මතෙව් 1:20). මේ නිසා, උන්වහන්සේ තුලට මනුෂ්‍ය සංහතියේ ඇති පාපකාරී ස්වභාවය ඇතුල් වූයේ නැත. උන්වහන්සේ මුලුමනින්ම දෙවියන්වහන්සේ ලෙසත් මුලුමනින්ම මනුෂ්‍යයා ලෙසත් පාප රහිතව මෙ පොළොවේ ජීවත් වූ සේක.

## යේසුස්වහන්සේගේ මරණය.

ලෝකයේ සිටියාවූ, ආගමික වේවා, දේශපාලන වේවා, කුමන ආකාරයේ නායකයකුට වුව, ඔවුන් මනුෂ්‍යයන්ව සිටි නිසා තමාගේ ජීවිත ගමන කෙළවර කරන්නට සිදුවිය. ඔවුන්ගේ මරණ මොහොත පැමිණි විට ඉන් එහාට යන්නට හැකියාවක් ඔවුනට තිබුනේ නැත. ඔවුහු මලහ. එහෙත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මැරුණේ එසේ නොවේ. උන්වහන්සේ තම කැමැත්තෙන් සිය ජීවිතය පූජා කල සේක. "**මමම ඒක දෙමි ඒක දෙන්නට මට බලය තිබේ. නැවත ගන්නටද**

**මට බලය තිබේ" (යොහාන් 10:15,18).** මෙසේ කියන්නට පුලුවන්කම තිබුනේ යේසුස්වහන්සේට පමණි. උන්වහන්සේ ලෝකයට පැමිණියේද මේ එක අරමුණ පිණිසය. එනම් තමාගේ ජීවිතය සියලු මනුෂ්‍යයන් උදෙසා පරිත්‍යාග කරන පිණිසයි. සියලු මනුෂ්‍යයන්ගේ පාපවල දඩුවම උන්වහන්සේ විසින් කුරුසිය මතදී ගෙවා දමන ලදී. **"උන්වහන්සේම තමන්ගේ ශරීරයෙන් ගස පිටදී අපගේ පාපයන් ඉසුලූසේක"** කියා **1 පේත්‍රුස් 2:24** හි පවසන්නේ මේ ගැනයි.

## යේසුස්වහන්සේගේ නැවත නැගිටීම.

උන්වහන්සේ සිය කැමැත්තෙන් ජීවිතය පූජා කල මුත් තුන්වෙනිදා නැවත නැගුටුනුසේක. මක්නිසාද උන්වහන්සේව රඳවාගෙන සිටීමට මරණයට බලයක් තිබුණේ නැත. උන්වහන්සේ ජීවමානයේ අධිපතියයි. උන්වහන්සේ පාප රහිතය. පාප රහිත කෙනෙකු කෙරෙහි මරණයට කිසි බලයක් නැත. දැන් යේසුස්වහන්සේ ස්වර්ගයේ දෙවිපියාණන්වහන්සේගේ දකුණු පැත්තේ අපගේ ගැලවුම් කරුවාණන් ලෙස වැඩ හිදින සේක. උන්වහන්සේගේ මරණය හා නැවත නැගිටීම අපට බලපාන ආකාරය පහත පෙනෙන දේව වචන පද 2න් පැහැදිලිවේ. **"උන්වහන්සේ සඳහා නැගුටුවනු ලැබූ සේක" (රෝම 4:25). "නුඹලාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීම කරණ කොටගෙන ගැලවෙන්නාහුය" (1 පේත්‍රුස් 3:21).**

ඉතින් ප්‍රිය මිතුර, අප විසින් ඔබ වෙත



ප්‍රකාශ කරන්නේ මළ නමුත් දැන් ජීවත්වන සියලු බලය ඇත්තාවූ මේ ගැලවුම්කාර ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේයි. ඔබට අද පටන් පාපයෙන් ජය සහිත, ප්‍රීතිමත්, අලුත් ජීවිතයක් ලබාදීමට උන්වහන්සේ සූදානම්ව සිටිනසේක. මේ වචන ඔබ විසින් කියවීමට ලැබීමද දෙවියන්වහන්සේගේ සැලැස්මට අනුව සිදුවූවකි. උන්වහන්සේ සියල්ල දන්නාසේක. ඔබගේ මනුෂ්‍යයන් කෙරෙන් සැඟවී තිබෙන යටි සිත පවා උන්වහන්සේ දන්නාසේක. ඔබගේ සිත ලඟ සිට උන්වහන්සේ කථා කරන්නේ ඒ නිසයි. ඔබගේ සිත යේසුස්වහන්සේට විවෘත කරන්න. ඔබගේ එකම ගැලවුම්කරුවාද, ස්වාමින්වහන්සේද කොට යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පිළිග න්න. ඒ මොහොතේම උන්වහන්සේ ඔබ සමඟ සිටින බව ඔබට වැටහි යනවා ඇත. ඔබ මීට පෙර හෝ මේ දැන් යේසුස්වහන්සේ ඔබගේ පුද්ගලික ගැළවුම්කරුවාද ස්වාමින්වහන්සේද ලෙස පිළිගෙන, අදහාගෙන තිබේ නම් අප වෙත ඒ බව ලියා දන්වන්න. ඔබගේ ආත්මික වර්ධනය පිණිසද, ආත්මික ආරක්ෂාව පිණිසද, අපගේ සේවය ස්වාමින්වහන්සේ තුල ඔබ වෙත විවෘතව ඇත.

**- ජීවන හඬ -**

# අප මධ්‍යස්ථානයේ පැවැත්වෙන රැස්වීම්.

## ඉරිදා

පෙ.ව 8.15 - 9.15 - ඉරිදා පාසැල
අවුරුදු 3-18 දක්වා ළමුන් සඳහා

පෙ.ව 9.30 - 12.00 - රොටි කැඩීමේ හා නමස්කාර රැස්වීම
(සිංහල , දෙමළ , ඉංග්‍රීසි)

ප.ව 4.00 - 5.00 - සුභාරංචි රැස්වීම - (සිංහල)

ප.ව. 6.00 - 7.00 - සුභාරංචි රැස්වීම - (ඉංග්‍රීසි)

## අඟහරුවාදා

ප.ව 6.30 - 7.30 - සුභාරංචි රැස්වීම
(දෙමළ)

## බදාදා

ප.ව 6.00 - 7.30 - යාච්ඤා රැස්වීම
අසනීප අය සඳහා තෙල් ආලේප කර
යාච්ඤා කිරීම

## සිකුරාදා

ප.ව 6.00 - 7.30 - බයිබල් අධ්‍යයනය

www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197



NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com